**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.01.13 වන දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව.**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 ජනවාරි මස 13 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු උපසභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. (2021.12.09)**

2021.12.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

2021.12.09 දින මහා සභාවේ තීරණ අංක 49 සම්බන්ධව අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ එම යෝජනාව මහ සභාවේ ඉල්ලීමක් ලෙස දිස්ත්‍රික් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ යුතු බවට ද තීරණය කළ බවත් නමුත් වාර්තාවෙහි එය සඳහන් නොවන බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ තීරණය පරිදි සභාවේ බලවත් විරෝධය සහිත ලිපියක් මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට යොමු කළ බවත් , විපක්ෂනායකතුමා ප්‍රකාශ කළ අදහස ඇතුලත්ව එම තීරණය සංශෝධනය කිරීම සුදුසු බවත් ය.

ඒ අනුව එම සංශෝධනයට යටත්ව 2021.12.09 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

නගර සභා / මහ නගර සභා / ප්‍රාදේශීය සභා වල සභිකයින්ගේ ධූර කාලය අවසන් වන දිනය 2023 මාර්තු මස 19 වැනි දින දක්වා දීර්ඝ කරන බවට රාජ්‍ය සේවා , පළාත් පාලන අමාත්‍ය , ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා ප්‍රසිද්ධ කළ අංක 2262/8 - 2022 ජනවාරි මස 10 වැනි සඳුදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**03.සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම. - නැත.**
**04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**
**05.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**I. <u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

01. බෝපැත්ත ග්‍රාම නිලධාරී වසමේ ඉහළ බෝපැත්ත ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය ලේකම්ට හෝ ප්‍රාදේශීය සභාවට පවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පැල්මඩුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලිපියක් යොමු කර ඇත.ඒ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙය නිරාකරණය කිරීමට ඇති සුදුසු ම ක්‍රමය මෙම ක්‍රීඩා පිටිය සභාවට පවර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම බව ය.

ගරු පවිත්‍රා වන්නි ආරච්චි මැතිතුමිය තරුණ කටයුතු ඇමති ලෙස කටයුතු කරන අවධියේ වාචිකව මෙම ඉඩම ලබා දී ඇති බවත් , ක්‍රීඩා පිටියෙහි යම් පුද්ගලයෙක් නිවසක් ඉදිකර ඇති බවත් , එම පුද්ගලයින් ව්‍යාජ ලෙස ලිපි ලේඛන සාදා ඇති බවත් , ඔවුන් නිවසට විදුලිය ලබා ගැනීමට කිහිප අවස්ථාවක දී ම උත්සාහ කළ ද මෙම ගැටළුව නිසා අවස්ථාව ලබා නොදීමට බෝපැත්තෙ ප්‍රදේශයේ රාජකාරී කටයුතු කළ ග්‍රාම නිලධාරිවරයා කටයුතු කළ බවත් , වත්මනෙහි රාජකාරී කටයුතු කරන ග්‍රාම නිලධාරීවරයා ද ඒ සම්බන්ධව දැනුවත් කළ යුතු බවත් , නැතිනම් පසුව එය ගැටළුවක් විය හැකි බවත් පැවසූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා මෙය සභාවට පවර ගෙන සංවර්ධනය කළ යුතු බවටත් අදහස් දක්වන ලදී.

හිටපු තරුණ කටයුතු ඇමති පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිතුමිය සාකච්ඡාවක් පවත්වා බෝපැත්තට ගොස් මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා රු.50,000.00 ක් ලබා දුන් බවත් , හිටපු මාර්ග ක්‍රීඩා අමාත්‍ය අතුල ඇමතිතුමා රු.ලක්ෂ 4 ක් ලබා දී ක්‍රීඩා පිටිය කපා සංවර්ධනය කළ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා පවසා සිටි අතර ක්‍රීඩා පිටිය නිත්‍යානුකූලව පවර ගන්නා ලෙස ද ඉල්ලා සිටින ලදී.

සියලු දෙනාම ගරු සභාපතිතුමාගේ සහය ඇතිව මේ සම්බන්ධව කටයුතු කළ යුතු බවත් , ක්‍රීඩා පිටියට ලබා දුන් ඉඩමෙන් එකඟතාවය නැතිව අඟලක්වත් ලබා නොදෙන ලෙසත් , මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට පවර ගෙන ගමට යහපතක් වන ලෙස කටයුතු කළ යුතු බවත් පැවසූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා පුහුණු වැඩමුළුවක් හෝ පවත්වා සභාවේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව මන්ත්‍රීවරුන් දැනුවත් කළ යුතු බවත් පවසන ලදී.

ගරු අතුල ඇමතිතුමා ලබා දුන් රු.ලක්ෂ 4 න් ක්‍රීඩා භූමියෙහි සංවර්ධන කටයුත්තක් සිදු කළා ද යන්නත් , සංවර්ධන කටයුත්තක් සිදු වුනා නම් භූමිය රජයට අයිති බවත් ගරු විපක්ෂනායකතුමා පවසා සිටි අතර ඊට පිළිතුරු ලබා දෙමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා පවසා සිටියේ සංවර්ධන කටයුත්තක් සිදු වුනා යන්නය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වත්තෙන් වාචිකව නිදහස් කර ඇති බවත් , පවතින තත්වයත් සමඟ රජයෙ නිලධාරියෙකුට කිසිම ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බවත්,මායිම් නිශ්චිත නොවන බවත් ය. තව ද එය රජයෙන් සංවර්ධනය කරනවාට වතු සමාගමෙන් කිසිම විරෝධයක් නොමැති බවත් එතුමා පවසන ලදී.

මැනුම් නියෝගයක් ගෙන මැන සභාවට පවර ගත යුතු බවට ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

බෝපැත්ත සමන් දේවාලයේ නින්දගමක් බවත් , රජයට පවර ගැනීමට නොහැකි බවට දේවාලෙගම පනතේ ඇති බවත් , සමන් දේවාලයෙන් ලබා ගත යුතු වුවත් ලබා ගැනීමට නීත්‍යානුකූල තත්වයක් නොමැති බවත් ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා පවසන ලදී.

අවසන් වශයෙන් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ බෝපැත්ත ග්‍රාම නිලධාරී වසමේ ඉහළ බෝපැත්ත ක්‍රීඩා පිටිය පැල්මුඩල්ල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම්තුමාට ලිපියක් යැවීමට කටයුතු කිරීම සුදුසු බව ය.

**<u>තීරණ අංක 01</u>**

බෝපැත්ත ග්‍රාම නිලධාරී වසමේ ඉහළ බෝපැත්ත ක්‍රීඩා පිටිය පැල්මුඩල්ල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම්තුමාට ලිපියක් යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

02. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ලබා දුන් නිර්දේශයට අනුව පැල්මඩුල්ල , බත්ගම්ගොඩ , දිනූ ඇපරල් ආයතනය වෙතින් බැහැර කරන කසල වෙනුවෙන් 2022 ජනවාරි මස සිට මාසිකව රු.2,000.00 ක කසල බදු මුදලක් අය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 02</u>**

මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා ලබා දුන් නිර්දේශයට අනුව පැල්මඩුල්ල , බත්ගම්ගොඩ , දිනූ ඇපරල් ආයතනය වෙතින් බැහැර කරන කසල වෙනුවෙන් 2022 ජනවාරි මස සිට මාසිකව රු.2,000.00 බැගින් කසල බදු අය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03.කහවත්ත , පනාවැන්න , නින්දවත්ත පාර පදිංචි අඩු ආදායම්ලාභී එම්.චින්තක පුෂ්පලාල් ආරියදාස යන අයට සෙවිලි තහඩු ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 03</u>**

ස්ථාන පරීක්ෂකගේ හා අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව කහවත්ත , පනාවැන්න , නින්දවත්ත පාර පදිංචි අඩු ආදායම්ලාභී එම්.චින්තක පුෂ්පලාල් ආරියදාස යන අයට සෙවිලි තහඩු ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04**. පැල්මඩුල්ල , පාතකඩ , සිංගප්පුලිකන්ද පදිංචි අඩු ආදායම්ලාභී ඒ.එච්.නිමල් ආරියරත්න යන අයට වැසිකිළි ආධාර ද්‍රව්‍ය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 04**

ස්ථාන පරීක්ෂකගේ හා අවශ්‍ය අයගේ නිර්දේශයන් සහිතව පැල්මඩුල්ල , පාතකඩ , සිංගප්පුලිකන්ද පදිංචි අඩු ආදායම්ලාභී ඒ.එච්.නිමල් ආරියරත්න යන අයට වැසිකිළි ආධාර ද්‍රව්‍ය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** සන්නස්ගම , විහාරවත්ත දිමුතු මාර්ගයෙන් බෙදී යන අතුරු මාර්ගයෙන් ඌරාදෙනිය ගමේ නිවෙස් කිහිපයකට යාමට පහසුකම් සැලසෙන බැවින් එම මාර්ගය සකස් කිරීමේ දී ජලය ගලා බසින ස්ථාන 2ක් සකස් කිරීම සඳහා හියුම් පයිප්ප ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

සන්නස්ගම , විහාරවත්ත දිමුතු මාර්ගයෙන් බෙදී යන අතුරු මාර්ගයෙන් ඌරාදෙනිය ගමේ නිවෙස් කිහිපයකට යාමට පහසුකම් සැලසෙන බැවින් එම මාර්ගය සකස් කිරීමේ දී ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, ජලය ගලා බසින ස්ථාන 2ක් සකස් කිරීම සඳහා හියුම් පයිප්ප ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.**නාරංගොඩ වලව්වත්තට යන මාර්ගය ඉතා අබලන් තත්වයේ පවතින බැවින් එම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 06**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , නාරංගොඩ වලව්වත්තට යන මාර්ගය ඉතා අබලන් තත්වයේ පවතින නිසා එම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.**පැල්මඩුල්ල , මිදලන එම්.හැරියට් සල්ගාදු මහතාගේ නිවස අසල මාර්ගය මගීන්ට යාම සඳහා සුදුසු ආකාරයට ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 07**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , පැල්මඩුල්ල , මිදලන එම්.හැරියට් සල්ගාදු මහතාගේ නිවස අසල මාර්ගය මගීන්ට යාම සඳහා සුදුසු ආකාරයට ප්‍රතිසංස්කරණය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.වී.උපාලි මැතිතුමාගේ යෝජනා.**

01. ප්‍රාදේශීය සභාවට විශාල ආදායම් මාර්ගයක් අහිමි වී තිබෙන අනවසර පර්චස් 1 සිට 6 දක්වා ඉදිකර ඇති ගොඩනැගිලි වලට සභා කොන්දේසි මත ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ නාගරික සංවර්ධන අධිකාරියෙහි පනත ප්‍රාදේශීය සභා පනතට වඩා ඉහළින් ඇති බවත් , එනමුදු ප්‍රාදේශීය සභා බල සීමාව තුළ තීරණ ගැනීමට ප්‍රාදේශිය සභාව පත් වී ඇති බැවින් එම පනත් වලට එරෙහි නොවී ඒකමතික තීරණ ප්‍රාදේශීය සභාවට ලබා ගත හැකි බව ය. පර්චස් 1 සිට 6 දක්වා ඇති පොඩි වෙළෙඳසැල් හා ගොඩනැගිලි අනුමත කිරීම නාගරික සංවර්ධන අධිකාරියෙන් සිදු නොවන බවත් , එබැවින් නීත්‍යානුකූල බැංකු ණය ගැනීමට ගිය විට ජනයාට

ගැටළු පැන නගින බවත් , එනිසා සභාවේ බලතලත් සමඟ කොන්දේසි දමා නාගරික සංවර්ධන අධිකාරිය තීරණයක් ගත්තොත් ඊට අවනත වන ආකාරයට සභාවට ආදායමක් ලබා ගත හැකි ලෙස මිනිසුන්ට සහනයක් ලැබෙන ලෙස අවශ්‍ය කටයුතු කිරීම සඳහා මෙම යෝජනාව කළ බව ය.තව ද සමහර අවස්ථා වල දී පරම්පරාවෙන් එන ඉඩම් වලට අවුරුදු ගණන් නඩු තිබී පර්චස් 1ක් 2ක් එක් අයෙකුට ලැබෙන බවත් , එම අවස්ථා වලදී ඔවුන් අසරණ වන බවත් , ඒ මිනිස්සුන්ට සහනයක් සැලසිය යුතු බවත් ගරු උප සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ යෝජනාව වටිනා බවත් , නමුත් පර්චස් 1 සිට 6 දක්වා ඉදිකර ඇති ගොඩනැගිලි අනුමත නොකිරීමට පදනම කුමක් ද යන්නත් , නිවාස වල යෝග්‍යත්වය සම්බන්ධව ගැටළුවක් පැමිණියහොත් ඒවා සභාවට දැරීමට සිදු වන බවත් ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ සැලසුමක් අනුමත කරන විට වාතාශ්‍රය , වැසිකිළි , මාර්ග පහසුකම් ආදී බොහෝ දේවල් සලකා බලන බවත් , එනිසා පර්චස් 6 ට අඩු ඉඩම් සඳහා ගොඩනැගිලි අයදුම්පත් අනුමත කළ නොහැකි බවත් , රටේ මූලික නීතිය වෙනස් කළ නොහැකි බවත් , නාගරික සංවර්ධන අධිකාරිය තුළ පවතින ගොඩනැගිලි අයදුම්පත් සභාවට තනිව අනුමත කළ නොහැකි බවත් , කමිටුවකින් ඒවා අනුමත වන බවත් , කමිටුවට අනිවාර්යයෙන් ම නාගරික සංවර්ධන අධිකාරිය සිටින බවත් , එලෙස හැකියාවක් තිබේ ද යන්න සොයා බැලිය යුතු බවත් ය.තව ද මේවා ප්‍රායෝගික ගැටළු බවත් , පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පමණක් පොදු කාරණාවක් නොවන බවත් , මුළු ලංකාවටම තිබෙන ගැටළුවක් බවත් , එනිසා විෂයභාර ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**<u>තීරණ අංක 08</u>**

ප්‍රාදේශීය සභාවට විශාල ආදායම් මාර්ගයක් අහිමි වී තිබෙන අනවසර පර්චස් 1 සිට 6 දක්වා ඉදිකර ඇති ගොඩනැගිලි වලට සභා කොන්දේසි මත ගොඩනැගිලි අයදුම්පත් අනුමත කර දීම සම්බන්ධව විෂයභාර අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කිරීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. මහින්ද විද්‍යාලය ඉදිරිපිට ඇති කොට්ටා ගස කපා ඉවත් කර පාසල් දරුවන්ගේ සුරක්ෂිතභාවය රැකීම සහ ඉදිරිපිට ඇති කුණු කාණුව බැකෝ යන්ත්‍රය යොදා ගොඩ දමා දෙන ලෙසත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ර/මහින්ද විද්‍යාලය අසල ඇති මෙම කොට්ට ගස කපා ඉවත් කිරීම මගින් පාසල් දරුවන්ගේ සුරක්ෂිතභාවය රැකෙන බව ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා හා ගරු විපක්ෂනායකතුමා අදහස් දක්වන ලදී.

**<u>තීරණ අංක 09 - i</u>**

ස්ථානය පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා ගෙන , සභාවෙන් මිල ගණන් කැඳවා සුදුසු අකාරයට ර/මහින්ද විද්‍යාලය ඉදිරිපිට ඇති කොට්ටා ගස කපා ඉවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 09 – ii</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , ර/මහින්ද විද්‍යාලය ඉදිරිපිට ඇති කුණු කාණුව බැකෝ යන්ත්‍රය යොදා ගොඩ දැමීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාව සතු මාර්ග වල පැති බැම් ඉදිකිරීම , ජලනල එලීම , දුරකථන රැහැන් සවිවන කණු සිටවීම , විදුලි බල මණ්ඩලයේ විදුලි කණු සිටුවීම සහ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ යෝජනාවේ සඳහන් පරිදි අවසරයක් නැතිව ඉහත කාර්යයන් සිදු වන බැවින් ඉදිරියේදී ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඇතිව ඒවා සිදු කළ යුතු බව ය. නැතිනම් සංවර්ධනයක් සිදු කරන අවස්ථාවක ඒවා ඉවත් කිරීමට සිදු වුවහොත් එවැනි අවස්ථාවක ගැටළු ඇති වන බව ය.ඊට පක්ෂව ගරු විපක්ෂනායකතුමා ද අදහස් දක්වන ලදී.

**<u>තීරණ අංක 10</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාව සතු මාර්ග වල පැති බැමි ඉදිකිරීම , ජලනල එලීම , දුරකථන රැහැන් සවිවන කණු සිටවීම , විදුලි බල මණ්ඩලයේ විදුලි කණු සිටුවීම සහ වෙනත් අවශ්‍යතාවයන් සිදු කිරීමේ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු බවට අදාල ආයතන වලට ලිඛිතව දැනුම් දීම සුදුසු බවට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** වැසි කාලයට වෙරළුගස්වත්ත ගම්මානය මැදින් යන කාණුව නිසා ගෙවල් කිහිපයක් යට වන බැවින් , කාණුව ගොඩදමා පිළිසකර කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 11</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , වැසි කාලයට වෙරළුගස්වත්ත ගම්මානය මැදින් යන කාණුව නිසා ගෙවල් කිහිපයක් යට වන බැවින් කාණුව ගොඩදමා පිළිසකර කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**III. <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමාගේ යෝජනා.</u>**

**01.** දෙමනගම්මන ඉඹුල් පැලැස්ස මාර්ගයේ කඩා වැටී ඇති පස් කඳු ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 12</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , දෙමනගම්මන ඉඹුල් පැලැස්ස මාර්ගයේ කඩා වැටී ඇති පස් කඳු ඉවත් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** වැලිමළුව අක්කර 50 ඇලෙක්ෂ් ගැමිණි මහතාගේ නිවස අසල මාර්ගය හා කාණු කපා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 13</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , වැලිමළුව අක්කර 50 ඇලෙක්ෂ් ගැමිණි මහතාගේ නිවස අසල මාර්ගය හා කාණු කපා සංවර්ධනය කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** අක්කර 50 මාර්ගයේ දැනට පාරක් නොමැති මෛත්‍රී මහතාගේ නිවස සහ අනෙක් නිවාස සඳහා දැනට රක්ෂිතය කර ඇති ඉඩමේ මායිමෙන් නව පාරක් කපා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 14</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , අක්කර 50 මාර්ගයේ දැනට පාරක් නොමැති මෛත්‍රී මහතාගේ නිවස සහ අනෙක් නිවාස සඳහා දැනට රක්ෂිතය කර ඇති ඉඩමේ මායිමෙන් නව පාරක් කැපීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** වැලිමළුව ගල්කොරිය දීපිකා මහත්මියගේ නිවස දක්වා මාර්ගය කපා සකස් කර දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 15</u>**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර, වැලිමළුව ගල්කොරිය දීපිකා මහත්මියගේ නිවස දක්වා මාර්ගය කපා සකස් කර දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය.**

01. පහළ බෝපිටිය ඔස්ට්‍රේලිකොටුව මාර්ගයේ රෝහල හන්දියේ සිට ඉදිරියට දැඩි ලෙස මාර්ගය අබලන් වී ඇත.මේ නිසා රෝහලට එන රෝගීන්ට හා මෙම මාර්ගයේ ගමන් ගන්නා ජනතාව අපහසුතාවයට පත්ව ඇත.එමනිසා මෙම මාර්ගය හැකි ඉක්මණින් පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ පැල්මඩුල්ල රෝහල හා වැඩිහිටි නිවාසය ද තිබෙන බැවින් කඩිනමින් මෙම මාර්ගය පිළිසකර කළ යුතු බව ය.

**තීරණ අංක 16**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , පහළ බෝපිටිය ඔස්ට්‍රේලිකොටුව මාර්ගයේ රෝහල හන්දියේ සිට ඉදිරියට දැඩි ලෙස මාර්ගය අබලන් වී ඇති නිසා මෙම මාර්ගය හැකි ඉක්මණින් පිළිසකර කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. පහළ බෝපිටිය කළුගම්මුල්ල නාන පීල්ල හා ළිඳ ප්‍රතිසංස්කරණය කර ජනතා පරිහරණයට සුදුසු වන පරිදි සකස් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපතිතුමා ද මීට පක්ෂව අදහස් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 17**

ස්ථානය පරීක්ෂා කර බලා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර , පහළ බෝපිටිය කළුගම්මුල්ල නාන පීල්ල හා ළිඳ ප්‍රතිසංස්කරණය කර ජනතා පරිහරණයට සුදුසු වන පරිදි සකස් කිරීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමාගේ යෝජනා.**

**01.** පැල්මඩුල්ල ප්‍රදේශයේ බොහෝ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන ඇති බැවින් පැල්මඩුල්ල ආසනය ගෝලීය සංචාරක කළාපයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා ප්‍රකාශ කළ සිටියේ ගමේ පවතින ආර්ථික තත්වය සම්බන්ධව සිතා මෙම යෝජනාව කරන බවත් , පැල්මඩුල්ල ආසනය තුළ විශාල ආකර්ෂණයක් ඇති දියඇළි , ගංගා , කඳු , වතු ආශ්‍රිත ප්‍රදේශ පවතින බැවින් ඒවායින් ඵලදායි ප්‍රයෝජනයක් ගත හැකි බවත් ය.එනිසා පැල්මඩුල්ල ආසනයේ ඇති මෙම ස්ථාන එකතු කර වෙබ් අඩවියක් නිර්මාණය කර දේශීය මෙන් ම විදේශීය සංචාරකයින්ට ද අවශ්‍ය ස්ථාන තෝරා සංචාරය කිරීමට අවස්ථාව සැලසීමටත් , තේරීමේ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ඩොලර්ස් ලැබෙන ආකාරයට වෙබ් අඩවිය නිර්මාණය කළ යුතු බවත් , පැල්මඩුල්ල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ව ද දිරිගැන්විය යුතු බවත් , ගම්මාන වල මැටි , රා ආදී දේශීය කර්මාන්ත පවා මෙමගින් දියුණු කළ හැකි බවත් , කාලීන යෝජනාවක් බවත් එතුමා වැඩි දුරටත් අදහස දක්වමින් පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ඉතා වටිනා මෙම යෝජනාව සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් , කළු ගඟ දිගේ වැඩසටහන නිසා පැල්මඩුල්ල ප්‍රදේශය විශාල ලෙස ජනප්‍රිය වූ බවත් , නිර්මාණශීලීව නිවාඩු නිකේතන සාදා සභාවට ආදායමක් හා වටිනාකමක් ලබා ගත හැකි ලෙස පැල්මඩුල්ලෙහි පවතින සම්පත් වලින් සංචාරක පුරවරයක් සැකසිය යුතු බවය.

සියලුම මන්ත්‍රීවරු විසින් සංචාරක ස්ථාන සම්බන්ධව තොරතුරු ගරු සභාපතිතුමාට ලබා දීම සුදුසු බවත් , එමඟින් මෙම කාර්යය පහසු වන බවත් , සංවර්ධන කටයුතු වලදී පරිසරය ආරක්ෂා වන ආකාරයට ඒවා සිදු කළ යුතු බවත් , කාලීන යෝජනාවක් බවත් ගරු උපසභාපතිතුමා පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ යෝජනාව හා ඒ සම්බන්ධව ඉදිරිපත් කළ අදහස් වටිනා බවත් , සංචාරක ස්ථාන වලට සනීපාරක්ෂක පහසුකම් ආදිය සපයා සිරිනැරඹිය හැකි ආකාරයට සකස් කළ යුතු බව ය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පළමු අදියර ලෙස ආකර්ෂණීය ස්ථාන තෝරා ගෙන වෙබ් අඩවියක් සකස් කිරීම සුදුසු බවත් , එය ප්‍රසිද්ධ කළ යුතු බවත් , ඒ සඳහා යම් කිසි මුදලක් සභා අරමුදලින් වියදම් කළ යුතු බවත් ය.තව ද මේ සඳහා පුද්ගලික අංශය සම්බන්ධ කර ගත යුතු බවත් , කාමරයක් කුලියට දීමට හා ව්‍යාපාරයක් පටන් ගැනීමට කැමැත්තක් දක්වන අය සඳහා අවස්ථාව ලබා දීම සුදුසු බවත් , ඒ තොරතුරු ද මෙම වෙබ් අඩවියට ඇතුල් කිරීමට අවස්ථාව ලබා දිය යුතු බවත් , සභාවට මුදලක් ලැබෙන ආකාරයට සකස් කළ යුතු බවත් පැවසූ ගරු සභාපතිතුමා සියලු ම මන්ත්‍රීවරුන්ගේ සහය බලාපොරොත්තු වන බවත් පවසන ලදී.

<u>**තීරණ අංක 18**</u>

පැල්මඩුල්ල ප්‍රදේශයේ බොහෝ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන ඇති බැවින් පැල්මඩුල්ල ආසනය ගෝලීය සංචාරක කළාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා පළමු අදියර ලෙස ආකර්ෂණීය ස්ථාන ඇතුලත් කර වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** ඩොලර් ඉපයීමේ අන්තර්ජාල ව්‍යාපාර මඟින් පැල්මඩුල්ල ආසනයේ තරුණ තරුණියන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා පවසා සිටියේ ආණ්ඩුවෙන් පවත්වන වැඩමුළු සඳහා තරුණ තරුණියන්ගේ පෙළඹවීම අඩු බැවින් මන්ත්‍රීවරුන් හරහා හෝ පෙළඹවීම ඇති කළ යුතු බවත් , එමඟින් තරුණ තරුණියන්ගේ ආර්ථික ශක්තිය වැඩි කිරීමට හා රැකියා ගැටළුව විසඳීමට මෙන් ම පැල්මඩුල්ලෙහි ආර්ථික ගැටළුව විසඳීමටත් හැකි බව ය.තව ද මිනිසුන්ට වෙහෙස මහන්සිය නිවා ගැනීම සඳහා පැල්මඩුල්ල පොළ භූමියේ සෙනසුරාදා ඉරිදා දිනයන් හැර ඉතිරි දින වල සවස් කාලයේ ජංගම වෙළෙඳසැල් පවත්වා ප්‍රාදේශීය සභාවට එමඟින් ආදායමක් ලබා ගැනීමට හැකි ලෙස සකස් කළ යුතු බවත් , කොළඹ බදුල්ල මෙන් ම කොළඹ ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයේ මධ්‍යස්ථයේ පැල්මඩුල්ල පිහිටීම නිසා පැමිණෙන ජනයා පැල්මඩුල්ලේ නවතා ගැනීමට හැකියාව ඇති බවත් වැඩිදුරටත් එතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමියත් මේ හා සම්බන්ධ අදහස් පෙර සභා වාර වලදී යෝජනා කළ බවත් , ජනයා කැමති නම් ඉල්ලීමක් කළ හොත් එම අවස්ථා ලබා දීමට හැකි බව ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>**තීරණ අංක 19**</u>

ඩොලර් ඉපයීමේ අන්තර්ජාල ව්‍යාපාර මඟින් පැල්මඩුල්ල ආසනයේ තරුණ තරුණියන්ගේ ආර්ථික තත්වය නගා සිටුවීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**VI.** <u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමාගේ යෝජනා.**</u>

**01.** හන්දුරුකන්ද අක්කර 100 මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ජේ.සී.බී.යන්ත්‍රය දින 02 කට ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී

<u>**තීරණ අංක 20**</u>

කාර්මික නිලධාරියෙක් විසින් පරීක්ෂා කර වාර්තාව ලබා ගෙන , හන්දුරුකන්ද අක්කර 100 මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභාවේ ජේ.සී.බී.යන්ත්‍රය දින 02 කට ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>හදිසි යෝජනා</u>**

**<u>ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.</u>**

01. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආයතන වල ආරක්ෂාව තහවුරු කර ගැනීම හා පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය , කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානය , ගල්ලෙපිට ආදාහනාගාරය හා පැල්මඩුල්ල සතිපොළ යන ස්ථාන සඳහා ආවේශන (සී.සී.ටී.වී) කැමරා පද්ධති පිහිටුවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාවට පක්ෂව ගරු විපක්ෂනායකතුමා හා ගරු උප සභාපතිතුමා අදහස් දක්වන ලදී.

**<u>තීරණ අංක 21</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ආයතන වල ආරක්ෂාව තහවුරු කර ගැනීම හා පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය , කෙටේතැන්න කසළ කළමනාකරණ මධ්‍යස්ථානය , ගල්ලෙපිට ආදාහනාගාරය හා පැල්මඩුල්ල සතිපොළ යන ස්ථාන සඳහා කඩිනමින් මිල ගණන් කැඳවා ආවේශන (සී.සී.ටී.වී) කැමරා පද්ධති පිහිටුවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ගොඩහේන හෙවත් ගල්ලෙපිට වත්ත ඉඩම සම්බන්ධයෙන් සභාවට එදිරිව එම්.ඒ.ගාමිණි මල්වත්ත යන අය විසින් ගොනු කර ඇති නඩුව සඳහා 2021.11.11 දින සභාවේ තීරණ අංක 06 හි සඳහන් පරිදි සභාව වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥ ප්‍රදීප් මංගල මහතා සුදුසු බවට තෝරා පත් කර ගන්නා ලදී.පැල්මඩුල්ල දිසා අධිකරණයේ නඩු අංක 6840/C යටතේ විභාග වූ මෙම නඩුව සඳහා 2021.12.10 දින නීතිඥ ප්‍රදීප් මංගල මහතා පෙනී සිටීම වෙනුවෙන් රු.6,550.00 ක නීතිඥ ගාස්තු බිල්පත ඉදිරිපත් කර ඇති අතර එම මුදල ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**<u>තීරණ අංක 22</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ගල්ගොඩහේන හෙවත් ගල්ලෙපිට වත්ත ඉඩම සම්බන්ධව පැල්මඩුල්ල දිසා අධිකරණයේ නඩු අංක 6840/C යටතේ විභාග වූ නඩුව සඳහා 2021.12.10 දින නීතිඥ ප්‍රදීප් මංගල මහතා සභාව වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් රු.6,550.00 ක නීතිඥ ගාස්තු බිල්පත ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමට ඉදිරිපත් වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක වාර්ථා සලකා බැලීම - 2021-12-09 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2021-12-09 දින මහ සභාවේ තීරණ අංක 11 යටතේ වීථි පහන් අලුත්වැඩියාව සඳහා උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු බිල හා යා කර තිබූ ලිපිය විදුලි කාර්මික ශිල්පියෙක් සිටිය දී සහායක විසින් ලියා තිබූ බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

විදුලි කාර්මික ශිල්පීන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ නොමැති බවත් , දෙදෙනා ම සහායක දෙදෙනෙක් බවත් ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ මුද්‍රණ දෝෂ පැවතීම හේතුවෙන් බිල්පත් ගෙවීමට අදාල තීරණයන් මිල කමිටු වාර්තාවට ඇතුල් කිරීමේ දී බිල්පත් මුදල සංඛ්‍යාත්මකව මෙන්ම අකුරෙන් ද සටහන් කිරීම සුදුසු බව ය.එය සුදුසු බවට ගරු සභාපතිතුමා ද අදහස් දක්වන ලදී.

ඒ අනුව 2021-12-09 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2021-12-01 සිට 2021-12-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

PD–7614 දරණ කැබ් රථයට ටයර් 4ක් මිල දී ගැනීම හා සම්බන්ධ ගෙවීමක් ඇති බවත් , නමුදු මුදල් කමිටුවේ දී එක් ටයරයක් හොඳ තත්වයේ පැවතීම හේතුවෙන් ටයර් 3ක් මිල දී ගැනීම සුදුසු බවට කාර්මික නිලධාරියා විසින් නිර්දේශ කර තිබූ බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී. තව ද ගිය සභා වාරයේ දී මතක් කළ ආකාරයට කිලෝ මීටර් 5000 සේවාව මාස දෙකෙන් දෙකට සිදු කර ඇති බවත් , PF - 7484 වාහනයට ඉන්ධන භාවිතා කිරීම ඉහළ මට්ටමක පවතින බවත් , එය පිළිගත නොහැකි බවත් , කොට්ඨාසය මෙපමණ දුර නොමැති නිසා ගෙවීම් වාර්තාව සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බවත් එතුමා පවසන ලදී.

PD-7614 කැබ් රථය සඳහා ටයර් මිල දී ගැනීම හා සම්බන්ධව කාර්මික නිලධාරී නිර්දේශය සභාවට ඉදිරිපත් කරමින් එය නිවැරදි බවට තහවුරු කරමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වාහනයකට නව ටයර් දැමීමේ දී ටයර් 3ක් කිසිම අවස්ථාවක නොදමන බවත් , ටයර් 4ක් දැමිය යුතු බවත් ය.තව ද කොට්ඨාසය තුළ පමණක් වාහන ධාවනය නොකරන බවත් , අවශ්‍යතාවය අනුව රාජකාරී කටයුතු සඳහා යෑමට සිදු වන බවත් , අවශ්‍ය නම් ධාවන සටහන් බැලිය හැකි බවත් , වාහන ධාවනය සඳහා ඉන්ධන අත්‍යවශ්‍ය බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

කිලෝ මීටර් 5000 සේවාව සිදු කළ අවස්ථා දෙකක බිල් එකම ගෙවීම් වාර්තාවට ඇතුල් වී ඇති බව පිළිතුරු ලබා දෙමින් ගරු උප සභාපතිතුමා ද පවසන ලදී.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය පහුගිය මාසයේ වැඩ කළ ස්ථානය විමසූ අතර ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ නාරංගොඩ කොළණිය මාර්ගය කාණු දමා කිලෝ මීටර් එක හමාරක් පමණ සංවර්ධනය කළ බවත් , එය නිරීක්ෂණය කළ හැකි බවත් ය.

ඔරලෝසු කණුව අලුත්වැඩියා කිරීමට අදාල බිල්පත පනස් හයදහස් ගණනක් වන නමුත් ලක්ෂයකට වඩා දමා තිබූ බවත් , හිටපු කාර්මික නිලධාරී ගජනායක මහතාගෙන් ඒ සම්බන්ධව විමසූ අවස්ථාවේ පනස්හය දහස් ගණනකට පමණක් වගකිව හැකි බවත් , ඉතිරිය සඳහා වගකිව නොහැකි බවත් පැවසූ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදී.

අවශ්‍යතාවය අනුව ඔරලොසු කණුව සෑදූ බවත් , මුදල් වංචා කිරීමක් කිසිසේත් ම සිදු නොවූ බවත් , එසේ වංචා කිරීමට අවශ්‍ය නොවන බවත් , වවුචර් අධ්‍යනය කළ හැකි බවත් , වගකීමෙන් පවසනවා නම් සභාව කාරක සභාවක් බවට පත් කර කාර්මික නිලධාරී ගජනායක මහතා ගෙන්වා විමසූ හැකි බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මහතා ප්‍රකාශ කළ ඉහත කරුණ සම්බන්ධයෙන් ගජනායක මහතා ද සම්බන්ධ කර ගනිමින් පරීක්ෂයක් සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

PD-7614 දරණ කැබ් රථයෙන් තම වසමේ රෝගීන් 10 කට වඩා රෝහල් වලට රැගෙන ගොස් ඇති බවටත් , රාජකාරී කටයුතු සඳහා අනිවාරයෙන් ම වාහනය ධාවනය වන බවත් , ප්‍රාදේශීය සභා සීමාව තුළ පමණක් නොව අවශ්‍යතාවය අනුව නිරන්තරයෙන් කොළඹ ආදී දුර ප්‍රදේශ වලට යෑමට සිදු වන බවත් , කාර්යාලයට හා වාහන සඳහා බඩු ගෙන ඒම ආදියට මෙම කැබ් රථය ප්‍රයෝජනයට ගන්නා බවත් පැවසූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා තව දුරටත් පවසා සිටියේ කාර්මික නිලධාරී මහතාගේ ස්ථානීය පරීක්ෂණය අනුව වාර්තාවක් ලබා ගෙන ජේ.සී.බී.යන්ත්‍රයෙන් පස් ගොඩක් අරන් දැමීම පවා සිදු කරන බවත් , ඒවා දැනගෙන අදහස් ප්‍රකාශ කළ යුතු බවත් , සියල්ල ම විනිවිදභාවයෙන් සිදු වන බවත් ය.

පොරෝණුව හා බෝපැත්තෙ ජල විදුලි බලාගාර දෙකක් ඇති බවත් , එමඟින් බදු ආදායමක් ලබා ගැනීමට හැකියාවක් නොමැති නිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදි ලේකම්තුමිය බදු අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දීම සඳහා ඒවා පිළිබඳව විස්තර එවන ලෙස පැවසූ බවත් , එය යොමු කිරීමට කඩිනම් විය යුතු බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.තව ද ගෙවීම් වාර්තාව නිසි දින ලැබෙන නිසා විවාදයට තුඩු දෙන , සැකයට භාජනය වන දේවල් ලිඛිතව ගරු ලේකම්තුමාට ලැබීමට සැලැස්වීමෙන් ඊට අදාල ලිපිගොනු , වවුචර් , ධාවන සටහන් ආදිය රැගෙන මහා සභා දිනට පැමිණිය හැකි බවට ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ ගරු විපක්ෂනායකතුමා පැවසූ දෙවනි කාරණයට එකඟ වන බවත් , නිශ්චිතව තොරතුරු දැන ගෙන කරුණු ගොනු කර ගෙන සාක්කිත් සමඟ සභාවේ දී අදහස් ඉදිරිපත් කළ යුතු බවත් , නැතිනම් වැරදි පණිවිඩයක් සමාජගත වන බවත් , පරීක්ෂණයක් සිදු කිරීමට නම් ලිඛිතව ඉල්ලීමක් කරන ලෙසත් , ලිඛිතව ගෙනත් දුන් පසු පරීක්ෂණයක් කළ හැකි බවත් ය.

2021-12-01 සිට 2021-12-31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**08.වෙනත් කරුණු.**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්.**

වීථි පහන් සවි කිරීමේ දී කමිටුවක් මඟින් සුදුසු ස්ථාන තෝරා සවි කළ යුතු බවට තමන් යෝජනා කළ බවත් , එය ක්‍රියාත්මක වනවා නම් හොඳ බවටත් , සියලු දෙනාට බඩු මිල ඔරොත්තු නොවන බැවින් රජයෙ නිලධාරින්ට මාසික වැටුප වැඩි වීම නිසා ගරු මන්ත්‍රීවරුන්ට ද දීමනාව වැඩි කිරීම සඳහා ගරු සභාවේ යෝජනාවක් ලෙස ගරු ජනාධිපතිතුමාට ඉල්ලීමක් කිරීම සුදුසු බව ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදී.එය සුදුසු බවට ගරු උප සභාපතිතුමා ද අදහස් දක්වන ලදී.

ගරු උප සභාපති ඩී.වී. උපාලි මැතිතුමා පවසා සිටියේ වීථි පහන් සවි කිරීමේ දී දමන බණ්ඩල් වයර් විදුලි බල මණ්ඩලයෙන් ගලවා එල්ලා දමා යන බවත් , එනිසා බොහෝ තැන් වල වීථි පහන් නොමැති බවත් ඒ පිළිබඳව කටයුතු කළ යුතු බවත් ය.

විදුලි බල මණ්ඩලයෙන් මේ සම්බන්ධව විමසීමට කිහිපවතාවක දී උත්සාහ කළ ද සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ බව ගරු සභාපතිතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබා ගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගිතිය සාකච්ඡා කිරීම.**

2021-12-09 දින මහා සභාවේ තීරණ අංක 49 පරිදි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට සභාවේ බලවත් විරෝධය සහිත ලිපියක් යොමු කළ බව ගරු සභාපතිතුමා පවසන ලදී.

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 පෙබරවාරි 10 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපති තුමන්, විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් , මාධ්‍යවේදී මහතාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාව අවසන් කරන ලදී

**පෙ.ව. 11.45 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.**

වාර්තා ගත කළේ

2022-02-01 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා .................................................................. මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ........................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-02-10 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව